# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1652/50 - 2010 මැයි 06 වැනි බ්‍රහස්පතින්දා - 2010.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 154 වන වගන්තිය යටතේ පළකරනු ලබන නිවේදනය**

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 157(14අ) අනු වගන්තිය මගින් පැවරී ඇති බලය අනුව එකී ආඥාපනතේ 153 වන වගන්තියෙහි විධිවිධාන අනුව කළුතර නගර සභාව විසින් සාදන ලදුව 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 154 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කර අංක 1511/20 හා 2007 අගෝස්තු මස 24 දාතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ ත්‍රිරෝද රථ නවතා තැබීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ පහත උපලේඛනයෙහි විස්තර කර ඇති අතුරු ව්‍යවස්ථාව, ඉහත කී 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 154 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2009 ජුලි 07 වන දින බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා
බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2010 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

කළුතර නගර සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම

01. මේ අතුරු ව්‍යවස්ථා කළුතර නගර සභාවේ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මේ අතුරු ව්‍යවස්ථා, සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

03.1. සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේ ය.

03.2. ඉහත 03.1 ව්‍යවස්ථාව අනුව ත්‍රීරෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියක් මගින් එසේ කළ හැකි අතර, එය ගැසට් පත්‍රයේ පළකළ දිනක සිට හෝ එහි සඳහන් නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

03.3. ත්‍රීරෝද රථ නැවතුම් පොළ ස්ථාන නිශ්චය කිරීම එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණ සංශෝධනය කිරීම පළමුවන උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සභාව විසින් ලබාගත යුතු වේ.

03.4. 03.1 ව්‍යවස්ථාව අනුව නැවතුම් පොළක නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව අදාළ නැවතුම් පොළහි ප්‍රදර්ශනය කළ යුතුය.

03.5. නැවතුම් පොළහි ත්‍රීරෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියෙකු විසින් පළල අගල් 04 ක් වූ සුදු හෝ කහ පැහැති රේඛාවක් මගින් සළකුණු කර තිබිය යුතු ය.

04. නගර සභාව විසින් ත්‍රීරෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවැනි උපලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු පනවා අය කිරීම නිත්‍යානුකූල වන්නේය.

05. ත්‍රීරෝද රථ නැවතුම් පොළක නවතා තබන ත්‍රීරෝද රථ සඳහා බලපත්‍ර ලබාදීමේදී නැවතුම් පොළට ආසන්නතම පදිංචිකරුවන්ට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.

06.1. තුන්වන උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රීරෝද රථ නැවතුම්පොළහි නවතා තැබීම සඳහා නගර සභාවෙන් බලපත්‍රයක් ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා අයදුම්පත්‍රය රු. 50 ක මුදලක් ගෙවා සභාවෙන් ලබාගත යුතුය.

06.2. ත්‍රීරෝද රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේද පදවන්නා කුලී රියදුරෙකු නම් ඔහුගේ සහ අයිතිකරුගේද පහත සඳහන් ලේඛනවල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි විය යුතුය.

(i) ත්‍රීරෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය
(ii) ත්‍රීරෝද රථයේ ලියාපදිංචි සහතිකය
(iii) කුලී රියදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය.

06.3. සභාවේ බලපත්‍ර ලත් ත්‍රීරෝද රථ සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, බලපත්‍රය අවලංගු කරනු ලැබූ විට, ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතුය.

06.4. සභාව විසින් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා බලපත්‍ර ලබාදිය හැකිය.

06.5. වලංගු බලපත්‍රයේ ඡායා පිටපතක් පෙනෙන සේ ත්‍රීරෝද රථයේ ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතුය.

06.6. ත්‍රීරෝද රථයේ දකුණු පසින් මගීන්ට පිටවිය නොහැකි වනසේ අහුරා තිබිය යුතුය.

06.7. බලපත්‍රය ත්‍රීරෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතුය.

06.8. බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට සති දෙකකට පෙර බලපත්‍රය අළුත් කරවා ගැනීම ත්‍රීරෝද රථ අයිතිකරු විසින් කළ යුතුය.

06.9. ඉහත 06.4 අනුඡේදයේ මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ පනවා අය කළ යුතු බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයක හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි අයකළ යුතුය.

06.10. 4 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, ත්‍රීරෝද රථ නැවතුම් පොළකට ත්‍රීරෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතුය.

06.11. නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ වුවද පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියෙකු විසින් තාවකාලිකව ත්‍රීරෝද රථ නැවතුම්පළෙන් ත්‍රීරෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර, මෙම බලපත්‍රය ඊට බාධාවක් නොවිය යුතුය.

07. නැවතුම් පොළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

08. නැවතුම් පොළට ඇතුළුවන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රීරෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතුය.

09. නැවතුම් පොළක ත්‍රීරෝද රථය ඉවත් කර ගැනීමේ කාර්යයට අදාළ යම් අළුත්වැඩියාවක් මිස, නැවතුම් පොළ ඇතුළත වෙනත් කිසිදු ආකාරයක අළුත්වැඩියාවක් කිරීම නොකළ යුතුය.

10. යම් ත්‍රීරෝද රථයක් නතර කර තැබීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් නැවතුම් පොළකට ද එම බලපත්‍රය අදාළ වන නැවතුම් පොළෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුළී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රීරෝද රථයක් නවතා තැබීම නොකළ යුතුය.

11. මේ අතුරු ව්‍යවස්ථා සතියේ සෑම දිනකම 06.00 පැය සිට 20.00 පැය දක්වා බලාත්මකව පැවතිය යුතුය.

11.1. ඉහත 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් සභාවේ අවශ්‍යතාවය මත සභා යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකි අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ක්‍රියාත්මක විය යුතුය.

12. බලපත්‍රයක් හිමි සෑම ත්‍රීරෝද රථයක්ම නැවතුම් පොළ නතර කර ඇති අවස්ථාවේදී සේවයේ යෙදී සිටින රියදුරු හැර පිටස්තර පුද්ගයන් නිකරුනේ ගැවසීම නොකළ යුතුය.

13. නැවතුම් පොළක, කවර වූ හෝ තැනැත්තෙකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිදු පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතුය.

14. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටක වලංගු බලපත්‍රය ත්‍රීරෝද රථයේ රියදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතුය.

15.1. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එකී වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකට යටත් විය යුතුය. එකී උල්ලංඝනය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ එකී උල්ලංඝනය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ තත් කාර්යය සඳහා ඔහුගෙන් බලයලත් නිලධාරියෙකු හෝ භාර කරනු ලැබීමෙන් පසු හෝ එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

15.2. 15.1 ව්‍යවස්ථාව අනුව නිසි අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක පනවනු ලබන දණ්ඩනයකට අමතරව සභාව විසින් බලපත්‍රය අහෝසි කළ යුතුවේ.

15.3. ඉහත 15.1 අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩ මුදල් සභාවේ පොදු අරමුදලට බැර විය යුතුය.

16. අර්ථ නිරූපණය

''සභාව'' යන්නෙන් කළුතර නගර සභාව ද,

''සභාපති'' යන්නෙන් කළුතර නගර සභාවේ සභාපතිවරයා ද,

''සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙකු'' යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන නගර සභාවේ යම් නිලධාරියෙකු ද,

''සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියෙකු'' යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ නගර සභාවේ යම් නිලධාරියෙකු ද,

''බල ප්‍රදේශය'' යන්නෙන් 255 වන අධිකාරය වන 1939 අංක 61 දරන නගර සභා ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කර 1978 අගෝස්තු 10 වැනි දින පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද කළුතර නගර සභාවේ බල ප්‍රදේශය ද,

''ත්‍රීරෝද රථය'' යන්නෙන් කුළී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රීරෝද රථයක් ද,

''කුළී රියදුරෙකු'' යන්නෙන් ත්‍රීරෝද රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අය ද,

''නැවතුම් පොළ'' යන්නෙන් කළුතර නගර සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රීරෝද රථ නැවතුම් පොළ ද,

''නියමිත නැවතුම් පොළ'' යන්නෙන් කළුතර නගර සභාවේ සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරන ලද යම් නිශ්චිත නැවතුම් පොළක් ද,

''මාසිකව'' යන්නෙන් එක් එක් මාසය ආරම්භයේ පළමු වෙනිදා සිට ඒ ඒ මාසයට අදාළ දින 28 හෝ 30 හෝ 31 ද,

''ත්‍රෛයි මාසිකව'' යන්නෙන් මාසිකව යන අර්ථකථනය මගින් දී ඇති දින ගණන ඇති ජනවාරි 01 වෙනිදායින් ආරම්භ අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් මස 31 වන දා දක්වා ද,

''වාර්ෂිකව'' යන්නෙන් වර්ෂයක ජනවාරි මස 01 වනදායින් ආරම්භව දෙසැම්බර් 31 වනදායින් අවසන් වන ලිත් වර්ෂයන් ද,

''පොලිස් නිලධාරියෙකු'' යන්නෙන් 53 වන අධිකාරය වන 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 104 වන වගන්තිය මගින් දී ඇති අර්ථකථනයම ද,

''වෙනත් වාහන'' යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,

''ලියාපදිංචි හිමිකරු'' යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද,

''පීඩාකාරී ක්‍රියාව'' යන්නෙන් පීඩා ආඥාපනතේ ඊට දී ඇති අර්ථකථනයම ද අදහස් වේ.

17. මේ අතුරු ව්‍යවස්ථා සිංහල හා දෙමළ භාෂා පාඨ සම්බන්ධව යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**පළමුවන උපලේඛනය**

03.3 අතුරු ව්‍යවස්ථාව

පත් කරනු ලබන මාර්ග කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

01. කමිටුවේ සභාපති නගර සභාවේ සභාපති විය යුතු අතර ලේකම් සභාවේ ආදායම් පරීක්ෂකවරයා වේ.

02. නගර සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරී.

03. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

04. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

05. කළුතර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

06. කළුතර බස් කම්පැනි ලිමිටඩ්හි සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

07. සභා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයන්හි රථ වාහන පොලිසියේ ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු බැගින්.

08. සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රීරෝද රථ සංගම්වල නියෝජිතයෙකු බැගින්.

දෙවන උපලේඛනය

4 වන අතුරු ව්‍යවස්ථාව

ලදුපත් අංකය :
Reciept No :
0000

අංකය/No.
0000

**ත්‍රීරෝද රථ නැවතුම් පොළ බලපත්‍රය**

නම :
හැඳින්වීමේ අංකය :
ගාස්තුව :
නැවතුම් පොළ :
වලංගු කාලය :
දිනය :

සභාපති
කළුතර නගර සභාව

සෙ.මී. 13 න් යුත් විශ්කම්භයක් සහිත වෘත්තයකි.

පසුබිම දුඹුරු (Meroon Colour) පැහැති වර්ණයෙන් යුත් නගර සභා ලාංඡනයෙන් යුක්ත ආකෘතියේ පරිදි කරුණු අඩංගු ස්ටිකරයකි.

**තුන්වන උපලේඛනය**

06.2 අතුරු ව්‍යවස්ථාව

**ත්‍රීරෝද රථ නැවතුම් පොළ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත**

01. i. අයදුම්කරුගේ නම :
 ii. ස්ථිර පදිංචි ලිපිනය :
 iii. වරිපනම් අංකය :
 iv. ස්ථිර පදිංචියට අදාළ පළාත් පාලන ආයතනය :
 v. ජාතික හැඳුනුම්පත් අංකය :

02. i. ත්‍රීරෝද රථ ලියාපදිංචි අංකය :
 ii. පදවන්නා අයිතිකරුද නැතිනම්
 - කුලී රියදුරුද යන වග :

 (1) අයිතිකරු නම් වලංගු රියදුරු බලපත් අංකය :

 (2) කුලී රියදුරෙකු නම්,

 (අ) රියදුරුගේ නම :
 (ආ) ස්ථිර පදිංචි ලිපිනය :
 (ඇ) ජා. හැ. අංකය :
 (ඈ) වලංගු රියදුරු බලපත් අංකය :

03. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රීරෝද රථ නැවතුම් පොළ :

04. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය - මසකට/ මාස 03 ට/ අවුරුද්දකට :

මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත්, මගේ ත්‍රීරෝද රථ නැවතුම් පොළ බලපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත් නගර සභාව විසින් පනවා ඇති ත්‍රීරෝද රථ නැවැත්වීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

.................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : .......................................

........................................................................................................... මහත්මා / මහත්මියට ............................................... ......................................................................... අංක දරන ත්‍රීරෝද රථය ........................................................................................ දරන නැවතුම් පොළෙහි නැවැත්වීම සඳහා බලපත්‍රය .................................................. කාලයකට ලබාදීම අනුමත කරමි.

.................................................
සභාපති
කළුතර නගර සභාව.

දිනය : .......................................

05-480

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.